අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry Of Education

# මාර්ගගත අධ්‍යාපනය
## මාර්ගෝපදේශ සංග්‍රහය
## Guidelines for Online Education




# Motivated for Online Learning

Published by : ICT Branch MoE - May 2021

# මාර්ගගත අධ්‍යාපනය

## මාර්ගෝපදේශ සංග්‍රහය

# පෙළ ගැස්ම

- හැඳින්වීම
- මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ඉ-ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී  එක් එක් පාර්ශවයන්ගේ කාර්යභාරය හා වගකීම.
    - ශිෂ්‍ය ශිෂ්‍යාවන්
    - දෙමාපියන්/භාරකරුවන්
    - ගුරුවරුන්
    - විදුහල්පතිවරුන්
- ගුරුවරයාට භාවිත කළ හැකි මාර්ගගත ඉගෙනුම් ආධාරක
- මාර්ගගත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිදුවන අපහසුතාවල දී ක්‍රියා  කළ යුතු ආකාරය.

## හැඳින්වීම.

දිවයින පුරා පැතිර යන වසංගත රෝග ව්‍යාප්තිය හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ පැන නැගී ඇති අභියෝගාත්මක තත්ත්ව හමුවේ පාසල් නිසි පරිදි පැවැත්වීම ප්‍රායෝගික ව අපහසු වූ පසුගිය කාල වකවානුවල දී මාර්ගගත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත්/කලාප අධ්‍යාපන බලධාරීන් සහ පාසල් මගින් විවිධ විකල්ප වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මාර්ගගත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ නියැලීමේ දී දෙමාපියන්, භාරකරුවන් මෙන් ම පාසල් ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් ද විවිධ අභියෝගවලට මුහුණ දෙන බව නිරීක්ෂණය වී ඇත. එබැවින් මාර්ගගත/ දූරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය පවත්වා ගෙන යාමේ දී අවශ්‍ය වන මූලික උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර පාසල් පද්ධතිය වෙත හඳුන්වා දීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය හා අදාළ සියලු පාර්ශවවල අදහස් හා යෝජනා මත මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කෙරිණි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මගින් තම දරුවන් මාර්ගගත ව ඉගෙනුම් ක්‍රියාවලියට යොමු කිරීමේ දී දෙමාපියන් විසින් පිළිපැදිය යුතු උපදෙස් හා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග ද මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදයේ දී ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ කාර්යභාරය ද ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට යොමු වීම නව අත්දැකීමක් බැවින් ගුරුවරුන්ට, දෙමාපියන්ට, සිසුන්ට විවිධ ගැටලු මතු විය හැකි ය. එහෙත් මෙලෙස මාර්ගගත ක්‍රමය ඔස්සේ පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව හා ගුණාත්මකභාවයකින් යුතු ව පවත්වා ගෙන යාමේ දී මතු වන මෙවැනි විවිධ අභියෝගවලට විසඳුම් පොදුවේ ඉදිරිපත් කළ නොහැකි වුවත් සමාජයීය, සෞඛ්‍යමය, සංස්කෘතිකමය සහ සදාරාචාත්මක වැනි අංග ඔස්සේ අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් මෙහි ඇතුළත් කර ඇත.

තාක්ෂණය භාවිතයෙන් අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් පවතින මිථ්‍යා මත හා වැරැදි ආකල්ප ධනාත්මක ලෙස වෙනස් කර ගැනීමට දෙමව්පියන්ට ඉඩ හසර විවර කිරීම ද මෙම උපදෙස් සංග්‍රහයේ එක් අරමුණකි.

මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී ගුරුවරුන් සහ සිසුන් මුහුණුපාන දුෂ්කරතා මග හරවමින් ඒ සඳහා අවශ්‍ය නිසි මග පෙන්වීම් ලබා දීමත් මාර්ගගත අධ්‍යාපන ක්‍රියාවලියේ දී දෙමාපියන් සතු වගකීම හා කාර්යභාරය පිළිබඳ ව නිසි අවබෝධයක් ලබා දීම තුළින් බාධාවකින් තොරව දරුවන්ට අවශ්‍ය පහසුකම් සැලැස්වීම සඳහා දෙමාපියන් හා අදාළ සියලු පාර්ශව දැනුවත් කිරීමත් මෙම මාර්ගෝපදේශයේ අපේක්ෂාව යි.

**මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී එක් එක් පාර්ශවයන්ගේ කාර්යභාරය හා වගකීම.**

**ශිෂ්‍ය - ශිෂ්‍යාවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පාඩමක් සඳහා යොමු වීමේ දී අනුගමනය කළ යුතු උපදෙස්**


1.1 පාඩමට යොමු වීම සඳහා ගැලැපෙන පරිසරයක් තෝරා ගැනීම (මේ සඳහා දෙමාපිය/ වැඩිහිටි සහය ලබා ගන්න) හා ගැලපෙන / සුදුසු ඇඳුමකින් සැරසී පාඩමට සම්බන්ධ වීම.

1.2 පාඩම් සඳහා මාර්ගගත ව සම්බන්ධ වීමේ දී පාඩම් මග නොහැරෙන පරිදි සම්බන්ධ වීමට සුදුසු පරිදි කාලය වෙන් කර ගැනීම සඳහා දෛනික / සති කාල සටහන නිසි පරිදි යාවත්කාලීන කිරීම සහ එය හොදින් දර්ශනය වන ස්ථානයක තැබීම.

1.3 මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලියට සම්බන්ධ වීමේ දී ගුරුවරයා විසින් ලබා දෙන උපදෙස් අනුගමනය කිරීම.

- පාඩම් අතරතුරදී තම අදහස් දැක්වීමක දී පමණක් Unmute කරන්න.
- ප්‍රශ්නයක් ඇසීමේ දී හෝ පිළිතුරු ලබාදීමේ දී හෝ Hand raise කරන්න.
- අත්‍යවශ්‍ය පණිවුඩ සඳහා Chat box භාවිත කරන්න.
- ගුරුවරයා විසින් දැනුම් දෙන අවශ්‍ය අවස්ථාවල දී video on කරන්න.

1.4 මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලියට සම්බන්ධ වීමේ දී නිවැරදි ඉරියව් භාවිත කිරීම.



1.5 පාඩමට බාධා වන පරිදි ආහාරපාන ගැනීම ආදී අනෙකුත් ක්‍රියාකාරකම් සීමා කිරීම.

## දෙමව්පියන්/ භාරකරුවන්ගේ වගකීම සහ භූමිකාව.

- දරුවන්ගේ මූලික අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- දරුවන්ගේ කාල සටහන සම්බන්ධයෙන් පූර්ව දැනුවත් වීම.
- බාධාවකින් තොර ව අදාළ පාඩම් සඳහා සම්බන්ධ වීමට නිවසේ පරිසරය සකස් කිරීම. (රූපවාහිනී, ගුවන් විදුලිය ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවන අනවශ්‍ය ශබ්ද, නිවැසියන්ගේ කතා බහ ආදිය සීමා කිරීම)
- හැකි සෑමවිට ම දරුවා හා ගුරුවරයා අතර සිදුවන සන්නිවේදන ක්‍රියා අධීක්ෂණය කිරීම.
- මාර්ගගත අධ්‍යාපනය ලබා දීමේ දී මතු වන තාක්ෂණික ගැටලු නිරාකරණය කිරීම සඳහා සහය ලබා දීම. (දරුවා කායික හා මානසික පීඩාවට පත් නොකර පාඩම සඳහා අවකාශ සැලසීම)
- අසුන්ගත ක්‍රියාකාරකම් සඳහා පමණක් දරුවන් යොමු නොකර පාඩම් අතරතුර විවේකයේ දී එළිමහන් ක්‍රියාකරකම් හා ව්‍යායාම ආදිය සඳහා ද දරුවන් යොමු කිරීම සහ දෙමාපියන් ද ඒ සඳහා සම්බන්ධ වීම.
- සමහර සිසුන් සමාජ මාධ්‍ය පරිහරණයට යොමු වී ඇති බැවින් ඒ පිළිබඳ ව නිසි දැනුවත් කිරීම් සිදු කිරීම හා අධ්‍යාපන හා විෂය සමගාමී කටයුතු සඳහා ආරක්ෂාකාරී ව සමාජ මාධ්‍ය පරිහරණය කිරීමට අවස්ථාව ලබා දීම සුදුසු ය.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ අධ්‍යයන කටයුතුවල යෙදීමට දරුවන්ට පහසුකම් සැලසීම පිළිබඳ ව දැඩි අපහසුතාවක් පවතී නම් ඒ සම්බන්ධයෙන් අදාළ ගුරුභවතුන් සහ විදුහල්පති දැනුවත් කර ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අනිවාර්යයෙන් ම කටයුතු කළ යුතු ය.

- පාඩමට අදාළ කාල සීමාව තුළ පමණක් දරුවන් ඩිජිටල් උපකරණ ආශ්‍රිත ව කටයුතු කිරීම සුදුසු බව නිර්දේශ කරන අතර මේ සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අඛණ්ඩ හා නිසි අධීක්ෂණයක් පැවැතීම යෝග්‍ය ය.

- මාර්ගගත පාඩම් සඳහා සම්බන්ධ වීමේ දී අදාළ දූරකථන සේවා සැපයුම් ආයතන මගින් සපයනු ලබන මාර්ගගත අධ්‍යාපන පැකේජ සම්බන්ධයෙන් දැනුවත් වීම මෙන් ම ඉතා අඩු මාසික ගාස්තුවක් යටතේ එවැනි පැකේජයක් සක්‍රිය කර ගැනීම දෛනික ව දත්ත සඳහා මුදල් වියදම් කිරීමට වඩා වාසිදායක ය. එබැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම මගින් හඳුන්වා දී ඇති පාලනය කිරීමේ මෘදුකාංගයක් (child control software) ජංගම දූරකථනයට ඇතුළත් කර (install) ගැනීම තුළින් දරුවන් අනවශ්‍ය ලෙස අන්තර් ජාල ක්‍රියාකාරකම්වල නිරත වීම පාලනය කිරීමේ හැකියාව පවතී.

### ❖ ඉගෙනීමට ගැලපෙන පරිසරයක් සකස් කිරීම

මාර්ගගත ඉගැන්වීම් සිදු කිරීමේ දී අධ්‍යාපනික ක්‍රියාකාරකම් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර දිය යුතු ය. එම ස්ථානය නිශ්ශබ්ද, අවධානය වෙනතකට යොමු නොවන අඛණ්ඩ අන්තර්ජාල සම්බන්ධතාවක් සහිත, පිරිසිදු වාතාශ්‍රයකින් යුතු සහ ඩිජිටල් ආරක්ෂාවක් සහිත පරිසරයක් විය යුතු බව වැඩිහිටියන් අවබෝධ කර ගත යුතු ය.

## ගුරුවරුන්ගේ භූමිකාව

- මාර්ගගත මාධ්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන පාඩම් පාසල් පෙළ පොතට අදාළව සහ අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි සකස් කිරීම.
- සෑම විටම සිසුන්ගේ අවධානය පාඩමට රඳවා ගැනීමට හැකි වන පරිදි ආකර්ෂණීය ලෙස පාඩම සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.
- දරුවන් සමඟ අන්තර් ක්‍රියාකාරී ව පාඩම් සිදු කිරීමට හැකි සෑම අවස්ථාක ම කටයුතු කිරීම හා හැකි සෑම අවස්ථාවක ම දරුවන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීමට හැකි වන පරිදි පාඩම සැලසුම් කිරීම.

- එදිනෙදා පාඩමට අදාළ ව පසු වැඩ/ ඇගයීමක් ලබා දීම මගින් දරුවාගේ අවධානය පාඩමට යොමු වීමේ මට්ටම පරීක්ෂා කිරීමට පියවර ගැනීම.
- ඇගයීම් සහ පැවරුම් ලබා දීමේ දි සිසුන්ට අනවශ්‍ය පීඩනයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම.
- මාර්ගගත අධ්‍යයන කටයුතු සඳහා සම්බන්ධ නොවන සහ අඛණ්ඩ ව යොමු නොවන දරුවන් සම්බන්ධයෙන් පෞද්ගලික ව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම.
- දෙමාපිය ආර්ථික අපහසුතා හෝ වෙනත් ගැටලුවක් හෝ හේතුවෙන් අධ්‍යයන කටයුතු මග හැරෙන දරුවන් සම්බන්ධයෙන් (දරුවන්ගේ අනන්‍යතාව හෙළි නොවන පරිදි හා දරුවන් හා වැඩිහිටියන් අපහසුතාවට පත් නොවන පරිදි) පාසල් මට්ටමින් සුදුසු විකල්ප ක්‍රියා මාර්ග අනුගමනය කිරීම.
- මාර්ගගත ඉගැන්වීමේ දී ගැලපෙන/ සුදුසු ඇඳුමකින් සැරසී පාඩම ඉදිරිපත් කිරීම.

**<u>විදුහල්පති භූමිකාව</u>**

- ගුරුවරුන්ගේ මාර්ගගත ඉගැන්වීම් කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- මාර්ගගත ඉගැන්වීම් කටයුතුවල යෙදීමේ දී ගුරුවරුන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා/ ගැටලු සම්බන්ධයෙන් මැදිහත් වීම හා සුදුසු විකල්ප යෝජනා නිර්දේශ කිරීම.

- මාර්ගගත අධ්‍යාපනයට යොමු නොවන/ යොමු වීමට අපහසු සිසුන් සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කර සිසුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- මාර්ගගත ඉගැන්වීම් සඳහා භාවිත කරන කාලය/ වේලාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර සිසුන්ට අධ්‍යයන කටයුතුවල නිරත විය හැකි සුදුසු වේලාව/ කාලය ඒ සඳහා භාවිත කිරීම ගුරුවරුන් උනන්දු කර වීම. (රාත්‍රී කාලයේ ඉගැන්වීම/ දීර්ඝ කාලයක් ක්‍රියාත්මක සැසි ආදිය නුසුදුසු බව නිර්දේශ කෙරේ)

### ❖ <u>ආතතිය සහ අසාමාන්‍ය තත්ත්ව නිවැරැදිව කළමනාකරණය කිරීම</u>

මෙවැනි අනපේක්ෂිත කාලවල දී මිනිසුන්ගේ සාමාන්‍ය චර්යා හා ජීවන රටා කලබලකාරී ස්වරූපයක් පෙන්නුම් කරයි. ශිෂ්‍යයන්ගේ හැඟීම් සහ බිය ද වැඩි විය හැකි ය. මෙවැනි අවස්ථාවල දී දෙමාපියන්ගේ මානසික ආතතිය වැඩිවීම මෙන් ම දරුවන් ද අසහනකාරී තත්ත්වවලට මුහුණ දීම සිදු වේ. දරුවන්ගේ වයසට ගැලපෙන ලෙස නිවැරැදි තොරතුරු ලබා දීම මෙන් ම ඔවුන්ගේ අනවශ්‍ය බිය නැති කිරීම ද කළ යුතු ය.

## <u>සමාජ මාධ්‍ය පරිහරණය සීමා කිරීම</u>



## <u>ගුරුවරයාට භාවිත කළ හැකි මාර්ගගත ඉගෙනුම් ආධාරක/tools</u>

- Whats app
- Viber
- Zoom
- Cisco Webex
- Microsoft team

**<u>මාර්ගගත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මතුවන අපහසුතා අවම කර ගැනීම සඳහා සම්බන්ධ කර ගත යුතු පාර්ශව.</u>**

- පන්තිභාර ගුරුභවතා හෝ පාසලේ අදාළ බලධාරීන්
- අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව හෝ අදාළ විෂයභාර ශාඛාව
- පළාත්/ කලාප අධ්‍යාපන කාර්යාලවල අදාළ බලධාරීන්
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
- ජාතික ළමාරක්ෂක අධිකාරිය
- ශ්‍රී ලංකා පොලිස් අන්තර්ජාල අපරාධ පැමිණිලි මධ්‍යස්ථානය
- කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය






Classroom
moodle
ClassDojo
zoom
Google Meet
webex
Microsoft Teams
LIVE
Online
Education